# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

## පුරප්පාඩු

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයට අයත් කුරුවිට උප මධ්‍යස්ථානයේ අක්කර 50 ක භූමියක නැවත වගා කිරීමේ ව්‍යාපෘතියේ පහත සඳහන් තනතුර වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ව්‍යාපෘති නිලධාරී

**<u>සුදුසුකම්</u>** :

01. පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්ම විද්‍යා උපාධියක් ලබා තිබීම.

02. වෙනස්වන බාහිර පරිසර සාධකයන්ට අනුගත වෙමින් උද්‍යෝගයෙන් හා කැපවීමෙන් ආයතනික ඉලක්ක සපුරා ලියහැකි වීම.

**<u>වයස, වැටුප හා අනෙකුත් වරප්‍රසාද</u>** :

අවුරුදු 22 ට වඩා අඩු නොවිය යුතු අතර අවරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය.

මාසික දීමනාව රු.50,000.00 ක් වන අතර ඒ සඳහා වෙනත් කිසිඳු දීමනාවක් ගෙවනු නොලැබේ.

රබර් ක්ෂේත්‍රයේ වසර පහකට (05) වඩා වැඩි කාලයක් සේවය කර තිබීම විශේෂ සුදුසුකමක් වේ.

**<u>ව්‍යාපෘතියේ ස්වභාවය</u>** :

අක්කර 50 ක භූමි ප්‍රමාණයක රබර් නැවත ගලවා කුරුඳු, තේ අතිරේක බෝග ලෙස හා වෙනත් වගාවක් වැවීම හා ඉඩමෙහි කාර්යක්ෂමතාව උපරිම අයුරින් භාවිතා කිරීම බලාපොරොත්තු වේ.

මෙය වර්ෂයක කොන්ත්‍රාත් කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, වාර්ෂිකව එහි අවශ්‍යතාවය අනුව දීර්ඝ කරනු ලැබේ. එහිදී එම ව්‍යාපෘතියට තෝරාගනු ලබන අයදුම්කරු විසින් දක්වන දායකත්වය හා ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත වාර්ෂික ඇගයීමකින් පසුව, කළමනාකරණය විසින් ගනු ලබන තීරණ මත පමණක් සේවා කාලය දීර්ඝ කරනු ලැබේ. (එසේ සේවා කාලය දීර්ඝ කරනු ලබන්නේ උපරිම වශයෙන් එක් වර්ෂයක් සඳහා පමණි.)

**<u>අයදුම්පත් ක්‍රියාවලිය</u>** :

පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව සකසන ලද අයදුම්පත් 2023.10.16 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය. ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි තනතුර සඳහන් කළ යුතු වන අතර, දැනට රාජ්‍ය සේවයේ සංස්ථා/මණ්ඩල/පුද්ගලික ආයතනවල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත අදාල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

1. සම්පූර්ණ නම, වයස සහ විවාහක අවිවාහක බව
2. අදාල අධ්‍යාපන සහතික සහ උප්පැන්න සහතිකය ඇතුළු වෙනත් සහතික වල සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්යය වේ.
3. වර්තමාන සහ පසුගිය රැකියාවන් හි රැකියා යෝජකයන්ගේ නම, ලිපිනය සහ රැකියාව වෙනස් කිරීමට හේතු
4. අයදුම්කරුගේ කුසලතාවයන් සහ දැනුම ඇගයීමට හැකි ඥාතීන් නොවන නිර්දේශකවරුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කුමන ආකාරයකින් හෝ මේ සම්බන්ධයෙන් අනිසි බලපෑම් කිරීමද නුසුදුසුකමක් වනු ඇත.

අධ්‍යක්ෂ (වැ.බ)
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්
අගලවත්ත.
2023.09.21